ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2015/04/30 |

## 2015 අප්‍රේල් මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද.) (2006/07=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය 2015 අප්‍රේල් මාසයේ දී ලක්ෂ්‍යමය පදනම මත පූර්ව මාසයේ පරිදිම සියයට 0.1 හි නොවෙනස්ව පැවතිණි. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2015 මාර්තු මස පැවැති සියයට 2.5 හි සිට 2015 අප්‍රේල් මාසයේ දී සියයට 2.1 දක්වා පහළ වැටිණි.



කො.පා.මි.දර්ශකය 2015 මාර්තු මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා සියයට 0.2 කින් ඉහළ ගියේය. මාසය තුළ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ආහාර නොවන කාණ්ඩයේ රෙදිපිළි හා පාවහන්; නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන; ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු; සෞඛ්‍ය; සහ විවිධ භාණ්ඩ හා සේවා යන උප කාණ්ඩවල මිල ගණන්හි ඉහළ යෑම් වාර්තා විය. විනෝදාත්මක හා සංස්කෘතික; ප්‍රවාහන; අධ්‍යාපන සහ සන්නිවේදන යන උප කාණ්ඩවල මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.

කෙසේ වුවද, මෙම මාසය තුළ ආහාර මිල ගණන් පහළ යෑම 2015 අප්‍රේල් මස උද්ධමන පීඩනය අඩු කිරීමට හේතු විය. බොහෝ එළවළු වර්ග, සහල්, සමහර මත්ස්‍ය හා කරවල වර්ග, අමු මිරිස්, රතු ළූනු සහ පොල් ආදියෙහි මිල ගණන් 2014 මාර්තු මස පැවති මිල ගණන් සමග සසඳන විට පහළ ගියේය. කෙසේ වුවද, කුකුළු මස්, හරක් මස්, පොල් තෙල්, අර්තාපල්, දෙහි, ලොකු ළූනු සහ සමහර පළතුරු වර්ගවල සුළු වශයෙන් මිල ඉහළ යෑම් මෙම මාසය තුළ වාර්තා විය.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන මූලික උද්ධමනය ලක්ෂ්‍යාමය පදනම මත 2015 මාර්තු මස පැවති සියයට 1.4 හි සිට 2015 අප්‍රේල් මාසයේ දී සියයට 2.4 දක්වා ඉහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2015 මාර්තු මස පැවති සියයට 3.0 හි සිට 2015 අප්‍රේල් මාසයේ දී සියයට 2.9 දක්වා පහළ වැටිණි.